(අනෙකුත් රාජ්‍ය/ අර්ධ රාජ්‍ය නිලධාරීන්/ බාහිර පුද්ගලයින් සඳහා)

**අවසාන දිනය –** 2026.07.24

# ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන **මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - තෙවන කොටසේ (CEP III), නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ** තනතුර සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ස්ථිර නිලධරයන් ද ඇතුළුව සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මාර්ග ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ම කොළඹ ස්ථාපිත කර ඇත.

මෙම පත්වීම 2026.03.28 දිනැතිව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 හි විධිවිධානවලට යටත් වනු ඇත.

- **ව්‍යාපෘතියේ නම – මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - තෙවනකොටස (CEP III) (ඇමරිකානු ඩොලර් මිලියන 200ට වැඩි කාණ්ඩය)**

| **අංකය** | **තනතුරු නාමය** | **කළ.සේ. චක්‍රලේඛ අංක 02/2026 අනුව වැටුප් කාණ්ඩය** | **පුරප්පාඩු ගණන** |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | B | 01 |

**ඉහත සඳහන් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 අනුව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - B කාණ්ඩය තනතුරෙහි මූලික සුදුසුකම් පහතින් දක්වා ඇත (පහත දක්වා ඇති 01 හෝ 02 හෝ 03)**

**<u>නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ - B කාණ්ඩය</u>**

01. අදාළ ක්ෂේත්‍රයේ උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) / ආශ්‍රිත සාමාජිකත්වයක් / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

සමඟ

කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 11 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ සාමාජිකත්වය

සමඟ

කළමනාකරණ මට්ටමින් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 09 ක පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් අවුරුදු 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

03. රජයේ දීප ව්‍යාප්ත සේවාවක I වන පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්වයක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (ශාස්ත්‍රපති) ආශ්‍රිත සාමාජිකත්වයක්/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්

සමඟ

I වන පන්තියේ තනතුරේ අවම වශයෙන් අවුරුදු 04 ක පළපුරුද්දක් හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන තත්වයක්

සටහන-

- **අදාළ ක්ෂේත්‍රය යනු "සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය" යන්න වන අතර අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ද තිබිය යුතුය.**

**<u>පොදු කොන්දේසි:</u>**

- බඳවා ගැනීම්, වැටුප්, ප්‍රතිලාභ සහ අනෙකුත් සේවා කොන්දේසි මුදල් අමාත්‍යාංශය විසින් 2026.03.28 දින නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි දක්වා ඇති විධිවිධානවලට අනුකූල වේ.
- තෝරා ගැනීම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ අනෙකුත් චක්‍රලේඛ කොන්දේසි මත පදනම් වේ.
- සියලුම අයදුම්පත් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කර අදාළ ලේඛනවල සියලුම පිටපත් යැවිය යුතුය.
- අපේක්ෂකයින් තෝරා ගනු ලැබුවහොත් ප්‍රදේශයේ සහ/හෝ රටේ ඕනෑම ස්ථානයක වැඩ කිරීමට එකඟ විය යුතුය.
- ව්‍යාපෘති කාර්යාලය පළමු අදියර, තුන්වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

01. **වයස් සීමාව:**

- රාජ්‍ය, අර්ධ රාජ්‍ය නිලධාරීන් සඳහා අවුරුදු 60 ට අඩු
- අනෙකුත් අය සඳහා අවුරුදු 64 ට අඩු

**02. වැටුප:**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 මත පදනම්ව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**03. රැකියා කොන්දේසි:**

- මෙම පත්වීම කොන්ත්‍රාත් පදනම මත සිදු වේ.
- අයදුම්කරු දැනටමත් පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්, පත්වීම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයේ සඳහන් කර ඇති නිත්‍ය තනතුරේ පත්කිරීමේ බලධාරියා විසින් නිර්දේශ කරන ලද නිදහස් කිරීමේ පදනම සහ නිවැරදි නිදහස් කිරීම සලකා බැලීමේ පදනම මත පදනම් වේ.

- අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර නොමැති සහ අයදුම්පත සමඟ නිවැරදි දත්ත ඉදිරිපත් කර නොමැති අපේක්ෂකයින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි නිශ්චිතව දක්වා ඇති

සුදුසුකම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති අපේක්ෂකයින් පත්වීම් සඳහා සලකා බලනු නොලැබේ.

- පත්වීම ලබා දීම හෝ නොදීම, සේවා දීර්ඝ කිරීම් ලබා දීම චක්‍රලේඛ සහ අනෙකුත් විධිවිධානයන්ට අනුකූලව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අභිමතය පරිදි තීරණය වේ.

**04. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පූර්ණ වශයෙන් රජය සතු සමාගම් ඇතුළුව රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දැනටමත් දරන අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2026 හි 2.3.3 ඡේදයට අනුව නිත්‍ය තනතුරෙන් නිදහස් කිරීමේ කැමැත්ත සහ නිදහස් කිරීමේ පදනමේ නිර්දේශය ඇතිව එවිය යුතුය. (එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

**05. අයදුම්පත ඉදිරිපත් කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අධ්‍යයන සුදුසුකම් පිළිබඳ විස්තර, මූලික උපාධියේ විස්තරාත්මක පිටපත, සේවා පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, දැන්වීමේ දැක්වෙන තනතුරේ සහ ව්‍යාපෘතියේ නම එම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිඛිතව සඳහන් කර, **ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, "මගනැගුම මහමැදුර", අංක: 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට 2026.07.24 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දීමෙන් අමාත්‍යාංශයේ පරිපාලන අංශය වෙත** ඉදිරිපත් කළ යුතුය.

**06. විශේෂ අවධානය සඳහා**

- **ලබා දී ඇති ආකෘතියට අනුකූලව නිසි ලෙස පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
- **අයදුම්පත සමඟ සහතික පිටපත් ඉදිරිපත් කළ සුදුසුකම් පමණක් තෝරා ගැනීම සඳහා සලකා බලනු ලැබේ.**

**07. ඕනෑම විමසීමක් සඳහා කරුණාකර අමතන්න - 011-2271048**

**08. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කර ඇති මෙම දැන්වීමේ භාෂා පාඨ අතර යම් නොගැලපීමක් තිබේ නම්, සිංහල දැන්වීමේ ඇති කරුණු බලපැවැත්වෙනු ඇත.**

A-F කාණ්ඩය සඳහා අයදුම්පත් ආකෘතිය - ඇමුණුම 1

**ලේකම්**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**